*සියලුම හිමිකම් ඇවිරිණි*
*All Rights Reserved*

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# පළමු වාර පරීක්ෂණය 2018
# භූගෝල විද්‍යාව

**9 ශ්‍රේණිය** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න**

01 ආසියා මහාද්වීපයට නැගෙනහිරින් .................................................. පිහිටා ඇත. (ඉන්දියන් සාගරය / අප්‍රිකා මහාද්වීපය / පැසිපික් සාගරය)

02 ආසියා මහාද්වීපයේ උතුරු සීමාව .................................................. අක්ෂාංශය වේ. (80º / 180º / 25º)

03 ලෝකයේ වැඩිම ජන සංඛ්‍යාවක් වාසය කරන චීනය හා .................................................. යන රටවල් ආසියාවට අයිතිය. (ඉන්දුනීසියාව / ඉන්දියාව / පාකිස්ථානය)

04 අභ්‍යන්තර මුහුදකට ගලා බසින ආසියාවේ පිහිටි ගංගාවක් ලෙසින් .................................................. ගංගාව දැක්විය හැකිය. (හොවැංහෝ / යුරල් / ගංගානම්)

05 සාමාන්‍ය උෂ්ණත්වය 18 ºC ට වැඩි දේශගුණික කලාපය .................................................. කලාපය වේ. (නිවර්තන / සෞම්‍ය / ශීත)

- **අං 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශ නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06 දකුණු අක්ෂාංශ 23½º සිට 66½º දක්වා අයත් වන්නේ සෞම්‍ය දේශගුණික කලාපයට ය. (     )

07 ලෝකයේ ගැඹුරුතම මිරිදිය විල ආසියාවේ පිහිටි බෝල්කෑෂ් විල වේ. (     )

08 කේතු රූපාකාර හැඩයෙන් යුතු ශාක දක්නට ලැබෙන්නේ සෞම්‍ය දේශගුණික ප්‍රදේශවල ය. (     )

09 යුප්‍රටීස්-ටයිග්‍රීස් දෙගංමැදි ප්‍රදේශයේ අතීත මෙසපොතේමියානු ශිෂ්ඨාචාරය බිහිවී ඇත. (     )

10 අරාබි රටවල මොන්ගොලොයිඩ් වර්ගයට අයත් මානව වර්ග ජීවත් වේ. (     )

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11 ලෝකයේ ජන හීන කලාපයක් ලෙස හඳුනාගන්නේ මින් කවර ප්‍රදේශයන් ද?

(1) පාකිස්ථානය (2) මොංගෝලියාව (3) පිලිපීනය (4) ඉන්දියාව

12 මාලදිවයින වැදගත් වන්නේ ජන සංඛ්‍යාව ආශ්‍රිත මින් කවර කරුණක් නිසාද?

(1) ජන සංඛ්‍යාව අධික වීම.

(2) 2017 වන විට ආසියාවේ ජනාධිකම රට වීම.

(3) 2017 වන විට ආසියාවේ අඩුම ජන සංඛ්‍යාව ඇති රට වීම.

(4) වෙරලාසන්නව වැඩිම ජන සංඛ්‍යාවක් සිටින රට වීම.

13 ආසියාකරයට අයත් ඩුබායි රට වැදගත් වන්නේ මින් කවර කරුණක් සඳහා ද?

(1) කෘෂිකාර්මික අංශය (2) කාර්මික අංශය

(3) මෝටර් රථ අංශය (4) සේවා අංශය

14 කාරිෆ් හා රාබි යනු පාකිස්ථානයට අයත්

(1) කෘෂිකාර්මික වගා සෘතු දෙකකි. (2) කෘෂිකාර්මික භෝග වර්ග දෙකකි.

(3) මෝටර් රථ නිෂ්පාදන සමාගම් දෙකකි. (4) කෘෂි වගා බිම් ප්‍රදේශ දෙකකි.

15 ජපානයේ පෙට්‍රෝ රසායන කර්මාන්තය තුළින් නිපදවන ප්‍රධාන නිෂ්පාදන දෙකක් සඳහන් වන්නේ මින් කවර පිළිතුරේ ද?

(1) පරිගණක හා පරිගණක උපාංග (2) මෝටර් රථ හා රොබෝවරුන්

(3) ප්ලාස්ටික් හා පොලියෙස්ටර් (4) විදුලි උපකරණ හා රෙදිපිළි


- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති ඡේදයේ හිස්තැන් මත ලියන්න.**

මෝටර් රථ නිෂ්පාදනය (16) ..................................................... නැමති රටෙහි ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍රයකි. ලෝකයේ විශාලතම මෝටර් රථ නිෂ්පාදකයින් (17) ..................................................... දෙනා අතරින් එයට (18) .................................... වන ස්ථානය හිමිවේ. (19) ..................................................... යනු එහි එක් මෝටර් රථ නිපදවන විශාල සමාගමකි. උසස් තත්වය (20) ................................................. ඉන්ධන කාර්යක්ෂමතාවය, සුඛෝපභෝගී බව මෙහි මෝටර් රථ කර්මාන්තයේ සුවිශේෂී ලක්ෂණ වේ.

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.

01




(1) ඉහත දැක්වෙන ආසියාවේ සිතියමෙහි A වලින් දැක්වෙන රට හා B වලින් දැක්වෙන කඳුවැටිය නම් කරන්න. (ල. 02)


(2) C වලින් දැක්වෙන සාගරය හා D වලින් දැක්වෙන සානුව නම් කරන්න. (ල. 02)

(3) E නැමති රට නම් කර එය අයත් වන්නේ කුමන දේශගුණික කලාපයටදැයි දක්වන්න. (ල. 04)

(4) F වලින් දැක්වෙන දූපත් නම්කර එහි සුවිශේෂී ලක්ෂණ 2 ක් දක්වන්න. (ල. 04)

(5) G වලින් දැක්වෙන රට දක්වා එහි පිහිටීම පිළිබඳ ලක්ෂණ 2 ක් දක්වන්න. (ල. 04)

02




(1) මෙහි දැක්වෙන A, B, C දේශගුණික කලාප නම් කරන්න. (ල. 03)

(2) A කලාපයේ සීමාවන් ලෙස දැක්වෙන D හා E රේඛාවන් නම් කරන්න. (ල. 02)


(3) C කලාපයට අයත් දේශගුණික ලක්ෂණ 3 ක් දක්වන්න. (ල. 03)

(4) B දේශගුණික කලාපයට අයිති රටවල් 3 ක් නම් කරන්න. (ල. 03)

03 (1) පහත දක්වා ඇති වෘක්ෂලතා හා වන ජීවීන් ආශ්‍රිත ලක්ෂණ කුමන වෘක්ෂලතා කලාපයට අයත්දැයි ඉදිරියෙන් ලියා දක්වන්න.

1. අපි ශාක වර්ග බහුලය.
2. ශාක පත්‍ර ඉඳිකටු වැනි තුඩක් සහිතය.
3 සේබල්, මින්ක් වැනි සත්ව වර්ග ඇත.
4. ශාකවල පත්‍ර හැලීම වාර්ෂිකව සිදුවේ.
5. ඕක්, මල්බෙරි වැනි ශාක බහුලය.
6. ජෛව විවිධත්වය අධිකය. (ල. 06)

(2) ආසියා මහාද්වීපයේ දක්නට ලැබෙන දේශගුණ වර්ග ආශ්‍රිත පහත සටහන සම්පූර්ණ කරන්න.




(ල. 05)

04 (1) ආසියානු කලාපයේ සිටින මානව වර්ග හතරක් මෙම රූපවලින් දක්වේ. එම මානව වර්ග නම්කර ඔවුන් අයත් රටවල් එක බැගින් දක්වන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| |  |  |  |  |
| මානව වර්ගය | 1............................ | 2............................ | 3............................ | 4............................ |
| සිටින රට | 5............................ | 6............................ | 7............................ | 8............................ |

(ල. 08)

(2) ආසියාවේ ජන හීන ප්‍රදේශ දෙකක් හා ජනාධික ප්‍රදේශ එකක් දක්වන්න. (ල. 03)

05 (1) ආසියානු කලාපයේ පවතින රටවල් දෙකක ලක්ෂණ දැක්වෙන මෙම වගුව ආශ්‍රිත තොරතුරු නිවැරදිව සම්පූර්ණ කරන්න.

| | ජපානය | පාකිස්ථානය |
|---|---|---|
| 1. ප්‍රධාන නිෂ්පාදන | 1. ..........................................<br>2. .......................................... | 3. ..........................................<br>4. .......................................... |
| 2. ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම | 5. .......................................... | 6. .......................................... |
| 3. ආසන්න රටක් | 7. .......................................... | 8. .......................................... |

(ල. 08)

(2) ඩුබායි රට විසින් පවත්වාගෙන යන සේවා කර්මාන්ත 3 ක් දක්වන්න. (ල. 03)

06 (1) ශ්‍රී ලංකාවේ භෞතික භූ දර්ශනයට අනුව සිතියමේ දැක්වෙන 1, 2 හා 3 වලින් දක්වා ඇති භූ විෂමතා කලාප නම් කරන්න. (ල. 03)

(2) එම කලාපවල උස අනුව කලාප වෙන්කර දක්වන්න.


1 මීටර් ................. සිට ................. දක්වා

2 මීටර් ................. සිට ................. දක්වා

3 මීටර් ................. සිට ................. දක්වා

(ල. 06)

(3) අංක 1 භූ විෂමතා කලාපයේ භූ ලක්ෂණ 2 ක් දක්වන්න. (ල. 02)



07 දී ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

<u>හරහට</u>

(1) කාර්මික රටකි.

(2) නිවර්තන කලාපයට අයිති රටකි.

(3) ජන ඝනත්වය වැඩි ගංගා නිම්නයකි.

(4) ඉන්දියාවේ පිහිටි ගංගාවකි.

(5) රටවල ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකමකි.

(6) දෙගැම්මැදි ප්‍රදේශයක් මෙම ගංගාව නිසා නිර්මාණය වී තිබේ.

<u>පහළට</u>


(1) ආසියානු කලාපයේ ජනාධිකම රට වේ.

(2) ශ්‍රී ලංකාවට උතුරින් පිහිටි රටකි.

(3) බටහිර දිශාවෙන් පිහිටි ආසියාතික රටකි.

(4) ආසියාවේ පිහිටි කෘෂිකාර්මික රටකි.

(5) තිරිඟු, සහල් හා උක් වැනි දෑ මෙම ආර්ථික ක්‍රියාකාරකම්වලට අයත් ය.




(ල. 11)

## පිළිතුරු පත්‍රය - I කොටස

(01) පැසිපික් (02) 180x (03) ඉන්දියාව (04) යුරල් (05) නිවර්තන
(06) ✓ (07) × (08) × (09) ✓ (10) × (11) 2 (12) 3 (13) 4
(14) 1 (15) 3 (16) ජපානය (17) 10 (18) 6 (19) ටොයෝටා, නිසාන්
(20) කල් පැවැත්ම

(2 x 20 = 40)

## II කොටස

01 (1) A - චීනය B - හිමාලය (ල. 02)
(2) C - ඉන්දියන් D - ටිබෙට් (ල. 02)
(3) E - ඉන්දියාව, නිවර්තන දේශගුණය (ල. 04)
(4) ජපන් දූපත් - කාර්මික රටක්, මෝටර් රථ නිෂ්පාදනය ආදිය (ල. 04)
(5) ශ්‍රී ලංකාව - උතුරින් ඉන්දියාව, ආසියා මහාද්වීපයේ ඇත, ඉන්දියන් සාගරයේ ඇත, දූපතකි ආදිය (ල. 04)

02 (1) A - නිවර්තන B - සෞම්‍ය C - ශීත (ල. 03)
(2) කර්කටක නිවර්තනය - D මකර නිවර්තනය - E (ල. 02)
(3) C - උෂ්ණත්වය ඉතා අඩුය, වසරේ වැඩි කාලයක් හිම පතනය, හිම වැසි ලැබීම ආදිය (ල. 03)
(4) B - රටවල් නම් කිරීමට (ල. 03)

03 (1) 1. නිවර්තන වර්ෂා 2. කේතුධර වනාන්තර 3. කේතුධර වනාන්තර
4. පතනශීලී වනාන්තර 5. පතනශීලී වනාන්තර
6. නිවර්තන වර්ෂා වනාන්තර (ල. 06)
(2) 1. තාර් කාන්තාරය, මැදපෙරදිග රටවල් 2. මධ්‍යධරණී ප්‍රදේශය
3. තෙත් සෞම්‍ය දේශගුණය 4. සයිබීරියාව
5. කඳුකර දේශගුණය (ල. 05)

04 (1)

| | A | B | C | D |
|---|---|---|---|---|
| මානව වර්ගය | මොන්ගොලයිඩ් | කෝකසයිඩ් | මොන්ගෙලියාඩ් | කෝකසයිඩ් |
| රට | චීනය | ඉන්දියාව | කොරියාව | ශ්‍රී ලංකාව |

(ල. 08)

වෙනත් අදාළ රටවල් ද ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ල. 08)
(2) ජන හීන හා ජනාධික ප්‍රදේශ දැක්වීමට ලකුණු 03 යි.

05 (1) අදාළ කරුණු අනුව වගුව පිරවීමට ලකුණු ලබාදෙන්න. (ල. 08)
(2) සේවා කර්මාන්ත දැක්වීමට ලකුණු ලබාදෙන්න. (ල. 05)

06 (1) A වෙරළබඩ තැන්න B අභ්‍යන්තර තැනිතලාය C මධ්‍යම කඳුකරය (ල. 03)
(2) A මී. 0 - 30 දක්වා B 30 - 300 දක්වා C 300 ට වැඩි (ල. 06)
(3) වගුරුබිම්, බොකු, කලපු, තුඩු ආදිය (ල. 02)

07 හරහට
(1) ජපානය (2) මියන්මාරය (3) ඉරවඩි (4) ගංගානම් (5) කර්මාන්ත
(6) යුප්‍රටීස්
පහළට
(1) චීනය (2) ඉන්දියාව (3) ඉරානය (4) පාකිස්ථානය (5) කෘෂිකාර්මික

(ල. 11)